# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

---

# 1986 අංක 36 දරන හොරණ විද්‍යාරත්න සංගමය (සංස්ථාගත කිරීමේ) පනත

---

[සහතිකය සටහන් කළේ 1986 ඔක්තෝබර් මස 08 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1986 ඔක්තෝබර් මස 10 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැක

මිළ : ශත 60 යි

තැපැල් ගාස්තුව : ශත 75 යි

# 1986 අංක 36 දරන හොරණ විද්‍යාරත්න සංගමය (සංස්ථාගත කිරීමේ) පනත

[සහතිකය සටහන් කළේ 1986 ඔක්තෝබර් මස 08 වන දින.]

එල්. ඩී.—ඕ. 43/85

**හොරණ විද්‍යාරත්න සංගමය සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි.**

"හොරණ විද්‍යාරත්න සංගමය" යනුවෙන් හඳුන්වනු ලබන හා සඳහන් කරනු ලබන සංගමයක්, එකී සංගමයේ සාමාජිකයන් එකඟ වූ රීති අනුව එකී සංගමයේ පරමාර්ථ සහ එකී සංගමයට සම්බන්ධ සියලු කාරණා ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමේ සහ කරගෙන යාමේ කාර්යය සඳහා මෙතෙක් කල් ශ්‍රී ලංකාවේ හොරණ පිහිටුවා තිබූ හෙයින් ද: — පූර්විකාව.

එකී සංගමය පිහිටුවනු ලැබුවේ යම් පරමාර්ථ හා කරුණු සඳහා ද ඒ පරමාර්ථ හා කරුණු එකී සංගමය විසින් මෙතෙක් කල් සාර්ථක ලෙස ඉටු කර සහ ක්‍රියාත්මක කරගෙන ගොස් ඇති හෙයින් සහ එකී සංගමය සංස්ථාගත කරනු ලැබීමට ඉල්ලුම් කර ඇති හෙයින් ද එකී ඉල්ලීමට ඉඩදීම මහජන යහපත පිණිස වන හෙයින් ද:

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

1. මේ පනත 1986 අංක 36 දරන හොරණ විද්‍යාරත්න සංගමය (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. — ලුහුඬු නාමය.

2. (මෙහි මින් මතු "සංගමය" යනුවෙන් සඳහන් කරනු ලබන) හොරණ විද්‍යාරත්න සංගමයේ දැනට සාමාජිකයන් වූ සියලු තැනැත්තෝ ද මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාවට මින් මතු ඇතුළත් කරගනු ලබන සාමාජිකයෝ ද මේ පනත ආරම්භ වන දින සිට හා ඉන් පසු "හොරණ විද්‍යාරත්න සංගමය" යන නාමය සහ අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති (මෙහි මින් මතු "සංස්ථාව" යනුවෙන් සඳහන් කරනු ලබන) සංස්ථාවක් විය යුතු අතර, පොදු මුද්‍රාවක් තබාගෙන, එය පාවිච්චි කිරීමේ ද ස්වකීය අභිමතය පරිදි එය වෙනස් කිරීමේ ද පූර්ණ බලය හා අධිකාරය ඊට ඇත්තේය. තවද සංස්ථාව විසින් ද එයට විරුද්ධව ද එකී නාමයෙන් සියලු අධිකරණවල නඩු පවරනු ලැබිය හැකිය. — හොරණ විද්‍යාරත්න සංගමය සංස්ථාගත කිරීම.

3. සංස්ථාව පිහිටුවනු ලබන්නේ කවර සාමාන්‍ය පරමාර්ථ සඳහා ද ඒ පරමාර්ථ පහත දැක්වෙන පරිදි විය යුතු යයි මෙයින් ප්‍රකාශ කරනු ලැබේ:— — සංස්ථාවේ සාමාන්‍ය පරමාර්ථ.

(අ) හොරණ විද්‍යාරත්න පිරිවෙන් විශ්ව විද්‍යා පීඨය හා හොරණ ශ්‍රී ධම්මරතන පිරිවෙන ද මින් පසු පිහිටුවනු ලබන වෙනත් යම් පාඨශාලා සහ ආයතන ද පාලනය කිරීම හා පවත්වාගෙන යාම මගින් බෞද්ධ අධ්‍යාපනය නංවාලීම ;

(ආ) ජාතික හා සංස්කෘතික සේවා මධ්‍යස්ථාන පිහිටුවීම, පාලනය කිරීම සහ පවත්වාගෙනයාම ;

(ඇ) බෞද්ධ සංස්කෘතිය නගා සිටුවීම හා බුද්ධාගම පතුරුවාලීම;

ඒ 084792—7,200 (85/07)

(ඈ) සමාජ ශුභ සිද්ධිය අභිවර්ධනය කිරීම; සහ

(ඉ) පොත්පත්, සඟරා, වාර සංග්‍රහ සහ පත්‍රිකා මුද්‍රණය කිරීම හා ප්‍රසිද්ධ කිරීම.

සංස්ථාවේ සාමාන්‍ය බලතල.

4. සංස්ථාවේ පරමාර්ථ ඉටු කිරීම සඳහා අවශ්‍ය බැංකු ගිණුම් විවෘත කිරීමේ, පවත්වා ගෙන යාමේ සහ වැසීමේ ද ඇප ඇතිව හෝ නැතිව මුදල් ණයට ගැනීමේ හෝ ලබා ගැනීමේ ද ප්‍රදානයන් සහ පරිත්‍යාග භාර ගැනීමේ හෝ එකතු කිරීමේ ද සංස්ථාවේ අරමුදල් ආයෝජනය කිරීමේ ද සේවක පිරිස් සේවයේ නියුක්ත කර ගැනීමේ, සේවයෙහි යෙදවීමේ සහ සේවයෙන් පහ කිරීමේ ද බලය ඇතුළුව, සංස්ථාවේ පරමාර්ථ හෝ ඒ පරමාර්ථ අතුරින් යම් පරමාර්ථයක් ප්‍රවර්ධනය කිරීම සහ නංවාලීම සඳහා අවශ්‍ය හෝ යෝග්‍ය කවර ආකාරයක හෝ සියලු ක්‍රියා කිරීමේ ද කරුණු ඉටු කිරීමේ ද දේවල් ක්‍රියාවේ යෙදීමේ ද බලය මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව, සංස්ථාවට ඇත්තේ ය.

සංස්ථාවේ කටයුතු පරිපාලනය කිරීම.

5. (1) සංස්ථාවේ නිලධරයන්ගෙන් සහ සංස්ථාවේ රීතිවලින් විධිවිධාන සලස්වා ඇති පරිදි වූ ද ඒ රීතිවලට අනුකූලව තෝරා පත් කර ගනු ලබන්නා වූ ද වෙනත් තැනැත්තන්ගෙන සමන්විත වූ පාලක මණ්ඩලයක් විසින්, සංස්ථාවේ රීතිවලට යටත්ව, සංස්ථාවේ කටයුතු පරිපාලනය කරනු ලැබිය යුතුය.

(2) මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භ වන අවස්ථාවේදී ධුර දරන සංගමයේ පාලක මණ්ඩලයේ සාමාජිකයන් වන මෙහි උපලේඛනයේ නම් සඳහන් සාමාජිකයන්ගෙන් සංස්ථාවේ ප්‍රථම පාලක මණ්ඩලය සමන්විත විය යුතුය.

රීති සෑදීමේ බලය.

6. (1) සාමාජිකයන් ඇතුළත් කර ගැනීම, ඔවුන්ගේ ඉල්ලා අස්වීම හෝ ඔවුන් නෙරපීම සඳහා ද පාලක මණ්ඩලයේ, සංස්ථාවේ නිලධරයන්ගේ, නියෝජිතයන්ගේ සහ සේවකයන්ගේ හැසිරීම හා කාර්ය සම්බන්ධයෙන් ද සංස්ථාවේ කටයුතු කිරීමේදී අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය සම්බන්ධයෙන් ද, සාමාන්‍යයෙන් සංස්ථාවේ කටයුතු පරිපාලනය කිරීම සහ එහි පරමාර්ථ ඉටු කිරීම සඳහා ද මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන රීති, සාමාජිකයන්ගේ යම් මහා සභා රැස්වීමකදී ඊට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගෙන් තුනෙන් දෙකකට නොඅඩු ඡන්දයෙන් කලින් කල සෑදීමේ බලය සංස්ථාවට ඇත්තේ ය.

(2) (1) වන උපවගන්තිය යටතේ සාදනු ලැබූ සංස්ථාවේ රීති වෙනස් කිරීම, ඒවාට යමක් එකතු කිරීම, ඒවා සංශෝධනය කිරීම හෝ ප්‍රත්‍යාදිෂ්ඨ කිරීම, එවැනිම රැස්වීමකදී (1) වන උපවගන්තිය යටතේ රීති සාදනු ලබන ආකාරයෙන්ම කරනු ලැබිය හැකිය.

(3) සංස්ථාවේ සාමාජිකයෝ සෑම විටම සංස්ථාවේ රීතිවලට යටත් විය යුත්තාහ.

දේපළ පැවරීම.

7. මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භ වන අවස්ථාවේදී, සංගමයේ නමින් දරන ලදුව හෝ යම් තැනැත්තකුගේ නමින් සංගමය වෙනුවෙන් භාරයක් වශයෙන් දරන ලදුව එකී සංගමයට අයිතිව තිබුණු චංචල හෝ නිශ්චල සියලු දේපළ, මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාව වෙත පැවරෙන අතර ඒ දේපළ ද, එසේ එකී සංස්ථාව වෙත මෙයින් පවරා දෙනු ලැබේ. තවද, ඒ දේපළ ද, මින් මතු අත්කර ගනු ලබන චංචල හෝ නිශ්චල සියලු දේපළ ද දැනට ලැබී ඇති හෝ ඉදිරියට ලැබීමට ඇති සියලු දායක මුදල්, සම්මාදම් මුදල්, පරිත්‍යාග, ණය හා අත්තිකාරම් ද මේ පනතේ කාර්ය සඳහා, සංස්ථාවේ තත් කාලයේ වලංගුව බලපවත්නා රීති වලට යටත්ව, සංස්ථාව විසින් දැරිය යුතුය.

සංස්ථාව විසින් චංචල හෝ නිශ්චල දේපළ දැරිය හැකි බව.

8. යම් මිලට ගැනීමක්, ප්‍රදානයක්, ත්‍යාගයක්, අන්තිම කැමති පත්‍රයකින් මුදල් බැහැර කිරීමක් ප්‍රකාර හෝ අන්‍යාකාරයකින් හෝ සංස්ථාව සතු වන යම් චංචල හෝ නිශ්චල දේපළක් භාර ගැනීමටත් දැරීමටත් නීතියෙහි ලා හැකියාව සංස්ථාවට ඇත්තේ ය. තවද, එකී සියලු දේපළ, ඒවා විකිණීමේ, උකස් කිරීමේ, බද්දට දීමේ, හුවමාරු කර ගැනීමේ හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීමේ පූර්ණ බලය ඇතිව, මේ පනතේ කාර්ය සඳහා, සංස්ථාවේ රීතිවලට යටත්ව. සංස්ථාව විසින් දැරිය යුතුය.

සංගමයෙන් ගෙවිය යුතු හා සංගමයට අයවිය යුතු ණය.

9. මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භ වන අවස්ථාවේදී සංගමයේ පවත්නා සියලුම ණය හා බැරකම් මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාව විසින් ගෙවිය යුතු අතර සංගමයට අයවිය යුතු සියලුම ණය සහ සංගමය වෙත ගෙවිය යුතු සියලුම දායක මුදල් සහ සම්මාදම් මුදල් මේ පනතේ කාර්ය සඳහා සංස්ථාවට ගෙවනු ලැබිය යුතුය.

සංස්ථාවේ මුද්‍රාව තැබිය යුතු ආකාරය.

10. යටත් පිරිසෙයින් පාලක මණ්ඩලයේ සාමාජිකයන් දෙදෙනකු ඉදිරිපිටදී මිස සංස්ථාවේ මුද්‍රාව කිසිම සාධන පත්‍රයකට තබනු නො ලැබිය යුතු අතර තමන් පැමිණ සිටි බවට ලකුණක් වශයෙන් ඔවුන් විසින් එකී සාධන පත්‍රයෙහි තම නම් අත්සන් කළ යුතුය. එම අත්සන් කිරීම සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකුගේ අත්සන් කිරීමට බාහිරව විය යුතුය.

ජනරජයේ හා අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

11. මේ පනතෙහි සඳහන් තැනැත්තන්ගේ හා ඔවුන් මගින් ඔවුන්ගෙන් හෝ ඔවුන් යටතේ හිමිකම් පාන්නවුන්ගේ අයිතිවාසිකම්වලට හැර ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක හෝ වෙන යම් තැනැත්තකුගේ හෝ අයිතිවාසිකම්වලට මේ පනතෙහි ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් නො වන්නේ ය.

## උපලේඛනය

[5 (2) වන වගන්තිය]

(1) පූජ්‍ය හොරණ ජිනාලංකාර මහා ස්ථවිරයන් වහන්සේ,

(2) පූජ්‍ය කහටපිටියේ රාහුල හිමි,

(3) පූජ්‍ය හොරණ වජිරඤාන හිමි,

(4) පූජ්‍ය රැටියල පඤ්ඤාසාර හිමි,

(5) පූජ්‍ය එච්. පඤ්ඤාසේකර හිමි,

(6) පූජ්‍ය වයි. මහින්ද හිමි,

(7) පූජ්‍ය එච්. සුමංගල හිමි,

(8) පූජ්‍ය එච්. ඥානවිමල හිමි,

(9) පූජ්‍ය අයි. ධම්මාලංකාර හිමි,

(10) පූජ්‍ය යූ. ධම්මසිරි හිමි,

(11) පූජ්‍ය එන්. සරණසිරි හිමි,

(12) ඩී. ඩබ්ලිව්. එදුස්සූරිය මහතා,

(13) ජී. වී. කන්නන්ගර මහතා,

(14) කේ. ඒ. පියසේන පෙරේරා මහතා,

(15) ජී. ඩී. එල්. ගුණවර්ධන මහතා,

(16) එම්. වැවත්තගේ මහතා,

(17) සිරිසෝම තිලකරත්න මහතා,

(18) ඩී. ටී. කරන්නාගොඩ මහතා,

(19) ඩී. සී. එදිරිමාන්න මහතා,

(20) ඩී. එන්. වැලිකල මහතා,

(21) ඩී. විජේසිරිවර්ධන මහතා,

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ නීතිවල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 150 කි. (විදේශීය) රු. 200 කි. කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.